# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1974 ජූනි මස 19 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 ජූනි මස 28 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

# ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1974 ජූනි මස 19 වන දින]

එල්.ඩී.—ඕ. 2/72

සමාගම් ආඥාපනත යටතේ සංස්ථාගත කරනු ලැබ ඇතහොත් මිස නැතහොත් නිදහස් කරනු ලැබූ සමාගම් නම් මිස, සමාගම් විසින්, නිශ්චිත දිනයකින් පසු, ශ්‍රී ලංකාවෙහි දේපළ අයිතිව සිටීම හෝ යම් ව්‍යාපාරයක් පවත්වාගෙන යෑම තහනම් කිරීම පිණිස ද, එසේ සංස්ථාගත නොකරනු ලැබූ හෝ නිදහස් නොකරනු ලැබූ සමාගම්වල ව්‍යාපාර සියල්ල ම හෝ එයින් යම් කොටසක් වන්දි ගෙවීමේ ක්‍රමයට ආණ්ඩුව වෙනුවෙන් අත්කර ගත හැකි කරවීම පිණිස ද, ඒ වන්දි තක්සේරු කිරීම සඳහා විනිශ්චය අධිකාරයක් පත් කිරීම පිණිස ද, ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ :—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 19 දරන සමාගම් (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඩු නාමය.

## I වන කොටස

**ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ සංස්ථාගත කරනු ලැබ ඇතහොත් මිස නැතහොත් නිදහස් කරනු ලැබූ සමාගම් නම් මිස, සමාගම් විෂයයෙහි, නිශ්චිත දිනයකින් පසු බලපැවැත්වෙන ඇතැම් තහනම් කිරීම්**

2. (1) මේ පනතේ "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන 1974 සැප්තැම්බර් මස පළමු වන දිනයෙහි හා ඉන් පසු කිසිදු සමාගමක් විසින්, ඒ සමාගම ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ "පවත්නා සමාගමක්" වශයෙන් පිළිගනු ලැබ ඇතහොත් හෝ සංස්ථාගත කරනු ලැබ ඇතහොත් මිස නැතහොත් එය නිදහස් කරනු ලැබූ සමාගමක් නම් මිස— ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ සංස්ථාගත කරනු ලැබුවහොත් මිස, ඇතැම් නිදහස් කිරීම්වලට යටත්ව සමාගම් විෂයයෙහි බලපැවැත්වෙන ඇතැම් තහනම් කිරීම.

(අ) අයිතිකරු, හවුල් අයිතිකරු, බදු ගැනුම්කරු හෝ උකස් හිමි වශයෙන් නැතහොත් අන් ලෙසකින් ශ්‍රී ලංකාවේ යම් දේපළක යම් සම්බන්ධතාවක් නොදැරිය යුතු ය; නැතහොත්

(ආ) ශ්‍රී ලංකාවේ කිසිදු ව්‍යාපාරයක් පවත්වා ගෙන නො යා යුතු ය.

(2) නියමිත දිනයට පෙර, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ඒ දිනය කලින් කල වෙනස් කරනු ලැබිය හැකි අතර, ඉන් පසු, ඒ නියමයෙහි දැක්වෙන අලුත් දිනය මේ පනතේ කාර්යයන් සඳහා නියමිත දිනය ලෙස සලකනු ලැබේ.

3. (1) විධානයක දැක්වෙන්නා වූ ද ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ සංස්ථාගත නො කරන ලද්දා වූ ද යම් සමාගමක් හෝ සමාගම් පන්තියක් හෝ වර්ගයක් 2 වන වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරමින්, අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව එකඟත්වය ඇති ව, මේ කොටසෙහි නිදහස් කිරීමේ විධානයක් නිකුත් කිරීමට අමාත්‍යවරයා සතු බලය.

"නිදහස් කිරීමේ විධානය" යනුවෙන් සඳහන් කරනු ලබන ලිඛිත විධානයක් නියමිත දිනයට පෙර කලින් කල නිකුත් කළ හැකි ය. අමාත්‍යවරයා විසින් ඒ විධානය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කිරීමට සැලැස්විය යුතු ය.

(2) නියමිත දිනයෙන් පසු, අමාත්‍යවරයා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව එකඟත්වය ඇතිව, කලින් කල, නියමිත දිනයෙන් පසුව ඇති කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ හා විධාන යෙහි සඳහන් කරනු ලබන යම් සමාගමක් හෝ සමාගම් පන්තියක් හෝ වර්ගයක් 2 වන වගන්තියේ විධිවිධාන අදාළ වීමෙන් නිදහස් කරමින්, නිදහස් කිරීමේ විධානයක් නිකුත් කරනු ලැබිය හැකි ය. අමාත්‍යවරයා විසින් ඒ විධානය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කිරීමට සැලැස්විය යුතු ය.

(3) නිදහස් කිරීමේ විධානයක් එය වලංගුව පවත්නා තාක් හා ඒ තාක් පමණක් අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර යම් අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී හෝ එය ප්‍රශ්න නො කළ යුතු ය.

(4) නිදහස් කිරීමේ විධානයක් යම් සමාගමක් සම්බන්ධයෙන් නැතහොත් යම් සමාගමක් අයත් වන පන්තිය හෝ වර්ගය සම්බන්ධයෙන් තත් කාලයෙහි වලංගුව පවතී ද ඒ සමාගම "නිදහස් කරනු ලැබූ සමාගමක්" යනුවෙන් මේ පනතෙහි සඳහන් කරනු ලැබේ.

නිදහස් කිරීමේ විධානයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට අමාත්‍යවරයා සතු බලය.

4. (1) අමාත්‍යවරයා විසින් සිය විධානයේ දක්වන දිනයක සිට යම් සමාගමක් සම්බන්ධයෙන් හෝ යම් සමාගම් පන්තියක් හෝ වර්ගයක් සම්බන්ධයෙන් වූ නිදහස් කිරීමේ විධානයක් ප්‍රත්‍යාදිෂ්ට කරමින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ පූර්ව එකඟත්වය ඇති ව කලින් කල ලිඛිත විධානයක් නිකුත් කළ හැකි අතර ඒ ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ විධානය වලංගු වූ විට නිදහස් කිරීමේ විධානයේ බලපැවැත්ම නතර විය යුතු ය. ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ විධානය පිළිබඳ දැන්වීම අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කිරීමට සැලැස්විය යුතු ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ විධානයක් අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර, එය යම් අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී හෝ ප්‍රශ්න නො කළ යුතු ය.

විදේශීය සමාගම විසින් පවරනු ලබන ඇතැම් ඉඩම්, ඉඩම් ප්‍රති සංස්කරණ පනත යටතේ වූ උපරිමය අදාළ කිරීමේදී ගණන් නොගත යුතු බව.

5. ශ්‍රී ලංකාවෙන් පිටත ලියා පදිංචි කරන ලද හෝ සංස්ථාගත කරන ලද සමාගමකට 1971 මැයි මස 29 වන දිනයේ දී ශ්‍රී ලංකාවෙහි අයිතිව හෝ සන්තකව තිබුණු යම් වගා කරන ලද කෘෂිකාර්මික ඉඩමක් මෙම පනත ආරම්භ වීමේ දිනයෙන් පසු, එම සමාගම විසින්, ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ "පවත්නා සමාගමක්" වශයෙන් පිළිගනු ලැබ ඇති හෝ සංස්ථාගත කරනු ලැබ ඇති සමාගමකට පවරනු ලැබූ අවස්ථාවක, පසුව කී සමාගම සම්බන්ධයෙන් 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනතෙහි විධිවිධාන යටතේ වූ උපරිමය අදාළ කිරීමේ කාර්යය සඳහා කෘෂිකාර්මික ඉඩම්වල අක්කර ප්‍රමාණය ආගණනය කිරීමෙහි ලා එම ඉඩම ගණන් නොගත යුතු ය.

## II වන කොටස

**ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ සංස්ථාගත නො කරන ලද්දා වූ නිදහස් කරනු ලැබූ සමාගම් හෝ වන සමාගම්වල ව්‍යාපාර සියල්ල ම හෝ එයින් යම් කොටසක් ආණ්ඩුව සතු කිරීමට අමාත්‍යවරයා සතු බලය**

මේ කොටස යටතේ වූ සතු කිරීමේ නියමය.

6. (1) අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන ("මේ කොටස යටතේ වූ සතු කිරීමේ නියමය" යනුවෙන් මේ කොටසෙහි සඳහන් කරනු ලබන) නියමයක් මගින්, ඒ නියමයෙහි දක්වෙන දිනයක සිට, නිදහස් කරනු ලැබූ සමාගමක් නො වූ ද නියමිත දිනයේ දී ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ සංස්ථාගත කර නොමැත්තා වූ ද, ඒ නියමයෙහි දක්වෙන යම් සමාගමක ව්‍යාපාරය සම්පූර්ණයෙන් ම හෝ එහි යම් කොටසක් කලින් කල ආණ්ඩුව සතු කරනු ලැබිය හැකි ය.

(2) මේ කොටස යටතේ වූ සතු කිරීමේ නියමයක් ක්‍රියාත්මක වීමට පෙර, අමාත්‍යවරයා විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්—

(අ) ඒ නියමය වෙනස් කළ හැකි ය; නොහොත් සංශෝධනය කළ හැකි ය; නැතහොත්

(ආ) ඒ නියමය ක්‍රියාත්මක වන දිනය වෙනස් කළ හැකි ය.

(3) මේ කොටස යටතේ වූ සතු කිරීමේ නියමයෙහි ඒ නියමය අදාළ වන්නා වූ යම් සමාගමක ඒ නියමයෙහි දක්වෙන, අවස්ථාවෝචිත පරිදි සම්පූර්ණ ව්‍යාපාරයේ ම, නැතහොත් ඒ ව්‍යාපාරයේ කොටසේ පරම අයිතිය ඒ නියමයෙහි දක්වෙන දින යෙහි සිට සියලු බැඳීම්වලින් තොරව ආණ්ඩුව වෙත ලබා දීමේ බල පෑම ඇත්තේ ය.

(4) මේ කොටස යටතේ වූ යම් සතු කිරීමේ නියමයක් (2) වන උපවගන්තිය යටතේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන අමාත්‍යවරයාගේ යම් නියමයකට යටත්ව අවසානාත්මක හා තීරණාත්මක විය යුතු අතර යම් අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී හෝ එය ප්‍රශ්න නො කළ යුතු ය.

නියම බලධරයකු පත් කිරීම.

7. (1) මේ කොටස යටතේ වූ සතු කිරීමේ නියමයක් ක්‍රියාත්මක වීම කරණකොට ගෙන යම් සමාගමක සම්පූර්ණ ව්‍යාපාරය ම හෝ එහි යම් කොටසක් ආණ්ඩුව සතු වූ අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි ඒ ව්‍යාපාරය නැතහොත් එහි ඒ කොටස පාලනය කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් නියම බලධරයකු වශයෙන් නාමින් හෝ නිල නාමයෙන් යම් තැනැත්තකු පත් කළ හැකි ය.

(2) නියම බලධරයකු විසින් (1) වන උපවගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කටයුතු ඉටු කිරීමේ දී අමාත්‍යවරයා විසින් කලින් කල නිකුත් කරනු ලැබිය හැකි සාමාන්‍ය හෝ විශේෂ විධානවලට ඔහු යටත් විය යුතු ය.

මේ කොටස යටතේ වූ සතු කිරීමේ නියමයක් ක්‍රියාත්මක වීම කරණකොටගෙන ආණ්ඩුව සතු වූ යම් සම්පූර්ණ ව්‍යාපාරයක් හෝ එහි කොටසක් සන්තකයට ගැනීම.

8. (1) මේ කොටස යටතේ වූ සතු කිරීමේ නියමයක් කරණකොට ගෙන ආණ්ඩුව සතු වූ යම් සමාගමක, අවස්ථාවෝචිත පරිදි සම්පූර්ණ ව්‍යාපාරය ම හෝ එහි යම් කොටසක් ආණ්ඩුව වෙනුවෙන් නියම බලධරයකු විසින් හෝ යම් බලය ලත් නිලධරයකු විසින් සන්තකයට ගත හැකි ය.

(2) මේ කොටස යටතේ වූ සතු කිරීමේ නියමයක් ක්‍රියාත්මක වීම කරණකොට ගෙන ආණ්ඩුව සතු වූ යම් සමාගමක, අවස්ථාවෝචිත පරිදි සම්පූර්ණ ව්‍යාපාරයෙන් ම හෝ එහි යම් කොටසකින් සමන්විත වූ යම් දේපළක් සන්තකව සිටින තැනැත්තකු වෙත දෙනු ලබන දැන්වීමක් මගින් නියම බලධරයකු හෝ යම් බලය ලත් නිලධරයකු විසින්,—

(අ) සිය දැන්වීමේ දැක්වෙන දිනයේ දී හා වේලාවේදී හා ස්ථානයේ දී ආණ්ඩුව වෙනුවෙන් ඒ දේපළ සන්තකයට ගැනීමට ඒ බලධරයා හෝ නිලධරයා අදහස් කරන බව ඒ තැනැත්තාට දැන්විය යුතු ය; තව ද

(ආ) එසේ දැක්වෙන දිනයේ දී හා වේලාවේ දී එම ස්ථානයට පැමිණ ආණ්ඩුව වෙනුවෙන් ඒ දේපළවල සන්තකය භාර ගැනීමට ඒ බලධරයාට හෝ නිලධරයාට ඉඩ හරින ලෙස හා සහාය වන ලෙස ඒ තැනැත්තාට හෝ ඔහුගේ බලය ලත් අනුයෝජිතයාට නියම කළ යුතු ය.

(3) මේ වගන්තියේ ඉහත දැක්වුණු විධිවිධාන යටතේ යම් තැනැත්තකුට කරනු ලැබීමට නියමිත යම් දැන්වීමක් ලියාපදිංචි කළ ලිපියක් මගින් තැපැල් මාර්ගයෙන් ඔහුට යවන ලද්දේ නම් ඒ දැන්වීම ඔහු වෙත දෙනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(4) (අ) මේ වගන්තිය යටතේ තමාට දෙන ලද යම් දැන්වීමක නියමයන් කඩ කරන නොහොත් එම නියමයන් අනුව ක්‍රියා කිරීම පැහැර හරින; නැතහොත්

(ආ) මේ කොටස යටතේ වූ සතු කිරීමේ නියමයක් ක්‍රියාත්මක වීම කරණකොට ගෙන ආණ්ඩුව සතු වූ යම් සමාගමක සම්පූර්ණ ව්‍යාපාරයෙන් ම හෝ එහි යම් කොටසකින් සමන්විත වූ යම් දේපළක් ඕනෑකමින් ම හෝ නොසැලකිලිමත් කමින් විනාශ කරන, එයට අලාභ හානි කරන නොහොත් එය අබල කරන නැතහොත් විනාශ කිරීමට, එයට අලාභ හානි කිරීමට හෝ එය අබල කිරීමට සලස්වන, නැතහොත් එය ඕනෑකමින් ම සඟවන නොහොත් ඉවත් කරන; නැතහොත්

(ඇ) ඒ දේපළෙහි සන්තකය භාර ගැනීමෙහි ලා නියම බලධරයකු හෝ යම් බලය ලත් නිලධරයකු වළක්වන නොහොත් ඔහුට බාධා කරන, නැතහොත් යම් තැනැත්තකු ලවා එසේ වැළැක්වීම හෝ බාධා කිරීම කෙළින් ම හෝ අන් අයුරකින් කරවන

යම් තැනැත්තකු වරදකට වරදකරු විය යුතු අතර මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට අවුරුද්දකට නො වැඩි කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් පන් දහසකට නො වැඩි දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දඬුවම් දෙකට ම ඔහු යටත් විය යුතු ය.

(5) මේ කොටසෙහි "බලය ලත් නිලධරයා" යන යෙදුමෙන් මේ කොටසේ කාර්යයන් සඳහා බලය ලත් නිලධරයකු වශයෙන් නියම බලධරයකු විසින් පත් කරනු ලබන යම් නිලධරයෙක් අදහස් වේ.

මේ කොටස යටතේ වූ සතු කිරීමේ නියමයක් ක්‍රියාත්මක වීම කරණකොටගෙන ආණ්ඩුව සතු වූ යම් ව්‍යාපාරයක සම්පූර්ණ ව්‍යාපාරය ම හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් මේ පනත යටතේ ගෙවිය යුතු වන්දිවලට හිමිකම් පෑම සඳහා තැනැත්තන්ට දැනුම් දීම.

9. මේ කොටස යටතේ වූ සතු කිරීමේ නියමයක් ක්‍රියාත්මක වීම කරණකොට ගෙන යම් සමාගමක සම්පූර්ණ ව්‍යාපාරය ම හෝ එහි යම් කොටසක් ආණ්ඩුව සතු වූ අවස්ථාවක නියම බලධරයකු විසින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දැන්වීමක් මගින්, ඒ ව්‍යාපාරය හෝ එහි ඒ කොටස සම්බන්ධයෙන් මේ පනත යටතේ ගෙවිය යුතු මුළු වන්දි මුදල ම හෝ එයි යම් කොටසක් සම්බන්ධයෙන් ඒ දැන්වීමෙහි දක්වෙන දිනයේ සිට ගණන් ගනු ලබන මාස දෙකක කාලයක් තුළ ලිඛිත හිමිකම් පෑමක් ඉදිරිපත් කරන ලෙස හා තම හිමිකම් පෑම සනාථ කිරීම සඳහා තමා පිහිට පතා සිටින සියලු ලේඛන ඒ සමග ඉදිරිපත් කරන ලෙස ද එම හිමිකම් පෑමෙහි—

(අ) තම නම හා ලිපිනය;

(ආ) ඒ ව්‍යාපාරයෙහි හෝ ඒ කොටසෙහි ලා තමාට ඇති සම්බන්ධතාවේ ස්වභාවය;

(ඇ) තම හිමිකම් පෑමේ විස්තර; සහ

(ඈ) ඒ වන්දි මුදලෙන් කොපමණ ප්‍රමාණයකට තමා හිමිකම් පාන්නේ ද යන වග

දක්වන ලෙස ද ඒ ව්‍යාපාරය හෝ එහි ඒ කොටස එසේ සතු කරනු ලැබූ දිනයට පෙරාතුව ම වූ දිනයෙහි ඒ ව්‍යාපාරයෙහි හෝ එහි ඒ කොටසෙහි ලා යම් සම්බන්ධතාවක් දැරූ සෑම තැනැත්තකුට ම විධාන කළ යුතු ය.

මේ කොටස යටතේ වූ සතු කිරීමේ නියමයක් ක්‍රියාත්මක වීම කරණකොටගෙන ආණ්ඩුව සතු වූ යම් සමාගමක සම්පූර්ණ ව්‍යාපාරයම හෝ එහි යම් කොටසක් පිළිබඳ වන්දි තීන්දුවක් කිරීම විනිශ්චය අධිකාරය වෙත යොමු කිරීම.

10. (1) මේ කොටස යටතේ වූ සතු කිරීමේ නියමයක් ක්‍රියාත්මක වීම කරණකොට ගෙන ආණ්ඩුව සතු වූ යම් සමාගමක, අවස්ථාවෝචිත පරිදි සම්පූර්ණ ව්‍යාපාරය ම හෝ එහි යම් කොටසක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වන්දි මුදල නිශ්චය කිරීම නියම බලධරයකු විසින් විනිශ්චය අධිකාරය වෙත යොමු කළ යුතු අතර, වන්දි සම්බන්ධයෙන් ඉදිරිපත් කර ඇති හිමිකම් පෑම් සියල්ල ම ඒ හිමිකම් පාන්නන් විසින් ඔවුන්ගේ හිමිකම් පෑම් සනාථ කිරීම සඳහා ඉදිරිපත් කර ඇති සියලු ලේඛන ද සමග විනිශ්චය අධිකාරය වෙත යැවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ විනිශ්චය අධිකාරය වෙත කරනු ලබන යොමු කිරීමක් "වන්දි තීන්දුවක් සඳහා යොමු කිරීමක්" ලෙස මින් මතු මේ පනතෙහි සඳහන් කරනු ලැබේ.

ආණ්ඩුව වෙනුවෙන් දේපළ සන්තකයට ගැනීම සඳහා වූ විශේෂ බලතල.

11. (1) නියම බලධරයකු වෙත හෝ බලය ලත් යම් නිලධරයකු වෙත දක්වා ඇති හෝ දක්වනු ලැබීමට ඉඩ ඇති යම් බාධාවක් හෝ විරුද්ධකම් පෑමක් නිසා, මේ කොටස යටතේ වූ සතු කිරීමේ නියමයක් ක්‍රියාත්මක වීම කරණකොට ගෙන ආණ්ඩුව සතු වූ යම් සමාගමක සම්පූර්ණ ව්‍යාපාරයෙන් ම හෝ එහි යම් කොටසකින් සමන්විත වූ යම් දේපළක් ආණ්ඩුව වෙනුවෙන් සන්තකයට ගැනීමට ඒ බලධරයා හෝ නිලධරයා අපොහොසත් ව සිටින හෝ තමා එසේ ලා අපොහොසත් විය හැකි යයි ඒ බලධරයාට හෝ නිලධරයාට සිතෙන අවස්ථාවක, ඒ දේපළ තබා තිබෙන හෝ පිහිටි ස්ථානය විෂයෙහි අධිකරණ බලය දරන මහේස්ත්‍රාත් අධිකරණය වෙත ඒ වෙනුවෙන් ඒ බලධරයා හෝ නිලධරයා විසින් ඉල්ලීමක් ඉදිරිපත් කළ විට ආණ්ඩුව වෙනුවෙන් ඔහුට ඒ දේපළෙහි සන්තකය ලබා දෙන ලෙස පිස්කල්ට විධාන කෙරෙන ඒ අධිකරණයේ ආඥාවක් ලැබීමට ඒ බලධරයාට හෝ නිලධරයාට හිමිකම් ඇත්තේ ය.

(2) මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් පිස්කල් වෙත (1) වන උපවගන්තිය යටතේ ආඥාවක් නිකුත් කරනු ලැබූ අවස්ථාවක, ඔහු විසින් ඒ ආඥාව නො පමාව ක්‍රියාත්මක කොට එය ක්‍රියාත්මක කරනු ලැබූ ආකාරය ඒ අධිකරණය වෙත ලියවිල්ලකින් වාර්තා කළ යුතු ය.

(3) මහේස්ත්‍රාත් අධිකරණයක් විසින් (2) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා පිස්කල් විසින් හෝ ඔහුගේ විධානය යටතේ ක්‍රියා කරන යම් තැනැත්තකු විසින් ඒ ආඥාව අදාළ වන යම් චංචල දේපළක් තබා ඇති යම් ස්ථානයකට ඇතුළු වී ඒ චංචල දේපළ තහනමට ගැනීමට හෝ ඒ ආඥාව අදාළ වන යම් ඉඩමකට, ගොඩනැගිල්ලකට හෝ වෙනත් ඉදි කිරීමකට ඇතුළු වී එය පරිහරණය කරන යම් තැනැත්තකු ඉන් නෙරපීමට සහ ආණ්ඩුව වෙනුවෙන් ඒ චංචල දේපළෙහි, ඉඩමෙහි, ගොඩනැගිල්ලෙහි හෝ අන් ඉදි කිරීමෙහි සන්තකය භාර ගැනීමට බලය ලැබූ තැනැත්තා වෙත එහි සන්තකය භාර දීමට අවශ්‍ය විය හැකි යම් බලයක් පාවිච්චි කළ හැකි ය.

## III වන කොටස

### වන්දි විනිශ්චය අධිකාරය

වන්දි විනිශ්චය අධිකාරය පිහිටුවීම සහ ලේකම්වරයා පත් කිරීම ආදිය.

12. (1) මේ පනතේ කාර්යයන් සඳහා පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත (මේ පනතේ "විනිශ්චය අධිකාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) වන්දි විනිශ්චය අධිකාරයක් පිහිටුවනු ලැබිය යුතු ය:—

(අ) අධිකරණ පළ පුරුද්ද තිබෙන තැනැත්තෙක්, විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා ලෙස ;

(ආ) අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ අමාත්‍යාංශයේ වෙනත් යම් නිලධරයෙක් ;

(ඇ) මුදල් විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ භාණ්ඩාගාරයේ වෙනත් නිලධරයෙක්.

(2) විනිශ්චය අධිකාරයට ලේකම්වරයකු ද විනිශ්චය අධිකාරයේ කටයුතු ඉටු කිරීම සඳහා අවශ්‍ය වන වෙනත් නිලධරයන් සහ සේවකයන් ද පත් කරනු ලැබිය යුතු ය.

(3) විනිශ්චය අධිකාරයේ සාමාජිකයන්ට, නිලධරයන්ට සහ සේවකයන්ට මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇති ව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන ප්‍රමාණයකට අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

**13.** (1) විනිශ්චය අධිකාරය වෙත වන්දි තීන්දු සඳහා කරනු ලබන යොමු කිරීම් සලකා බලා නිශ්චය කිරීම පිණිස සභාපතිවරයාගේ මෙහෙයවීම යටතේ ලේකම්වරයා විසින් විනිශ්චය අධිකාරයේ රැස්වීම් කැඳවිය යුතු ය. *විනිශ්චය අධිකාරයේ රැස්වීම.*

(2) සභාපතිවරයා විනිශ්චය අධිකාරයේ රැස්වීම්වල මූලාසනය දැරිය යුතු ය.

(3) විනිශ්චය අධිකාරයේ රැස්වීමක් කලින් කල කල් තැබීම හෝ අඛණ්ඩව කල් තැබීම කළ හැකි ය.

**14.** වන්දි තීන්දුවක් සඳහා කරන ලද යම් යොමු කිරීමක පිටපතක් අදාළ සියලු ලියවිලි ද සමඟ ඒ යොමු කිරීම වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල සම්බන්ධයෙන් ප්‍රධාන තක්සේරුකරුගේ නිර්දේශ ලබා ගැනීම සඳහා ඔහු වෙත යවා ඔහුගේ නිර්දේශ ලබා ගන්නා තුරු ඒ යොමු කිරීම විනිශ්චය අධිකාරය විසින් සලකා බැලීම හෝ නිශ්චය කිරීම නො කළ යුතු ය. *ප්‍රධාන තක්සේරුකරුගේ නිර්දේශ ලබා ගත යුතු බව.*

**15.** (1) වන්දි තීන්දුවක් සඳහා කරනු ලබන සෑම යොමු කිරීමක් ම සලකා බැලීම සහ නිශ්චය කිරීම විනිශ්චය අධිකාරයේ රැස්වීමක දී කළ යුතු ය. *විනිශ්චය අධිකාරය ඉදිරියේ පැවැත්වෙන කටයුතු.*

(2) වන්දි තීන්දුවක් සඳහා වූ එක් එක් යොමු කිරීමක් විනිශ්චය අධිකාරය විසින් සලකා බැලීම සහ නිශ්චය කිරීම සඳහා දිනයක්, වේලාවක් සහ ස්ථානයක් නියම කිරීම විනිශ්චය අධිකාරයේ ලේකම්වරයා විසින් කළ යුතු ය.

(3) වන්දි තීන්දුවක් සඳහා වූ සෑම යොමුකිරීමක් ම පිළිබඳ ව විනිශ්චය අධිකාරය ඉදිරියේ පැවැත්වෙන සියලු කටයුතුවල වාර්තාවක් විනිශ්චය අධිකාරයේ ලේකම්වරයා විසින් තබා ගත යුතු ය.

**16.** (1) විනිශ්චය අධිකාරයේ රැස්වීමක දී සලකා බලනු ලබන යම් කරුණක් පිළිබඳව ඒ රැස්වීමේ දී කරනු ලබන නිශ්චය කිරීම විනිශ්චය අධිකාරයේ නිශ්චය ලෙස සලකනු ලැබිය යුතු ය. *විනිශ්චය අධිකාරයේ නිශ්චය.*

(2) විනිශ්චය අධිකාරයේ සෑම නිශ්චයක ම ඒ නිශ්චයට හේතු ඇතුළත් විය යුතු ය.

**17.** විනිශ්චය අධිකාරයෙහි කටයුතු සාමාන්‍යයෙන් හෝ සිරිත් පරිදි අධිකරණයකට අදාළ කාර්ය පටිපාටිය හා සාක්ෂි පිළිබඳ රීතිවල විධිතාවලින් හා රීත්‍යනුකූලත්වයෙන් හැකි තාක් දුරට තොර විය යුතු අතර විමර්ශනය කර ගෙන යනු ලබන කරුණු ඔප්පු කෙරෙන සාක්ෂ්‍ය එළිදරව් කර ගැනීම පිණිස යෝග්‍යතම *විනිශ්චය අධිකාරයක් ඉදිරියේ කාර්ය පටිපාටිය හා පරිචය.*

යයි විනිශ්චය අධිකාරයට පෙනී යන හා ස්වාභාවික යුක්ති ධර්මයේ සිද්ධාන්තවලට අනනුකූල නො වන කවර වූ හෝ ආකාරයකින් පවත්වා ගෙන යනු ලැබිය හැකි ය.

විනිශ්චය අධිකාරය වෙත කරන ලද යොමු කිරීමක් පිළිබඳව තීන්දුවක් කිරීමට පෙර විනිශ්චය අධිකාරය අනුගමනය කළ යුතු විධිවිධාන.

**18.** විනිශ්චය අධිකාරය වෙත වන්දි තීන්දුවක් සඳහා යොමු කිරීමක් කරනු ලැබූ අවස්ථාවක ඒ තීන්දුව කිරීමට පෙර විනිශ්චය අධිකාරය විසින්—

(අ) වන්දි සඳහා හිමිකම් පෑමක් කර ඇති සෑම තැනැත්තකුට ම ඔහු විසින් පෞද්ගලික ව ම හෝ තත් කාර්යය වෙනුවෙන් බලය පවරනු ලැබූ අනුයෝජිතයකු මගින් හෝ කරුණු කියා සිටීමටත් ඔහුගේ හිමිකම් පෑම තහවුරු කිරීමට සාක්ෂි ඉදිරිපත් කිරීමටත් අවස්ථාවක් දිය යුතු ය; තව ද

(ආ) ඒ යොමු කිරීමට විෂය වූ කාරණය වෙනුවෙන් ගෙවිය යුතු වන්දිය පිළිබඳව ප්‍රධාන තක්සේරුකරු විසින් කරන ලද නිර්දේශවල පිටපතක් ඒ සෑම තැනැත්තකුට ම හෝ අනුයෝජිතයකුට ම ලැබෙන්නට සැලැස්විය යුතු ය.

යොමු කිරීමක් කළ විට විනිශ්චය අධිකාරය කරන වන්දි තීන්දුව.

**19.** (1) ආණ්ඩුව සතු කරනු ලැබූ යම් සමාගමක දේපළ සම්බන්ධයෙන් වන්දි තීන්දුවක් කිරීම සඳහා විනිශ්චය අධිකාරය වෙත යොමු කිරීමක් කරනු ලැබූ විට, විනිශ්චය අධිකාරය විසින් ඒ කාර්යය ඉටු කිරීම සඳහා අවශ්‍ය වන සියලු කරුණු සලකා බැලීමෙන් හා එසේ අවශ්‍ය සියලු සාක්ෂි විභාග කිරීමෙන් පසුව ද, 18 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමෙන් පසුව ද,—

(අ) වන්දි සඳහා හිමිකම් පෑමක් කර ඇති එක් එක් තැනැත්තා වන්දි ලැබීමට හිමිකමක් ඇති තැනැත්තකු ද නැද්ද යන වග සහ ඒ තැනැත්තාට හිමිකමක් තිබේ නම් ඔහුට ඒ හිමිකම ඇත්තේ කවර තත්ත්වයකින් ද යන වග;

(ආ) ඒ දේපළ වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල; සහ

(ඇ) වන්දි ලැබීමට හිමිකම් ඇති තැනැත්තන් අතර වන්දි මුදල කොටස් කර දීම

නිශ්චය කරමින් තීන්දුවක් කළ යුතු ය:

එසේ වුව ද, වන්දි ලැබීමට හිමිකම් ඇති තැනැත්තන් පිළිබඳව හෝ වන්දි ලැබීමට හිමිකම් ඇති තැනැත්තන් අතර වන්දි මුදල කොටස් කර දීම පිළිබඳව ආරාවුලක් ඇති වූ අවස්ථාවක, විනිශ්චය අධිකාරය තීන්දුවක් කිරීම කල් තබා ඒ ආරාවුල පිළිබඳ තීරණයක් සඳහා එය කොළඹ දිසා අධිකරණය වෙත යොමු කළ යුතු අතර ඒ ආරාවුල පිළිබඳව ඒ අධිකරණය එහි තීරණය දුන් විට තීරණයට අනුකූලව තීන්දුවක් කළ යුතු ය.

(2) විනිශ්චය අධිකාරය විසින් තීන්දුවක් කරනු ලැබූ විට—

(අ) ඒ තීන්දුව කරන ලද්දේ යම් සමාගමක දේපළ සම්බන්ධයෙන් ද ඒ සමාගම වෙත ද,

(ආ) වන්දි සඳහා හිමිකම් පෑ තැනැත්තන් වෙත ද

ඒ තීන්දුව පිළිබඳව ලිඛිත දැන්වීමක් දීමට සැලැස්විය යුතු ය.

(3) විනිශ්චය අධිකාරය විසින් කරනු ලැබූ තීන්දුවක් අවසානාත්මක හා නිරණාත්මක විය යුතු අතර එය කිසි ම අධිකරණයක දී හෝ විනිශ්චය අධිකාරයක දී හෝ ප්‍රශ්න නො කළ යුතු ය.

වන්දි ගෙවීම.

**20.** II වන කොටස යටතේ ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ යම් සමාගමක සම්පූර්ණ ව්‍යාපාරය වෙනුවෙන් හෝ ඒ ව්‍යාපාරයෙහි යම් කොටසක් වෙනුවෙන් ගෙවිය යුතු වන යම් වන්දියක් යම් නිලධරයකුට එයින් ගෙවිය යුතු යැයි 21 වන වගන්තියෙන් නියමිත යම් මුදලක් ඉන් අඩු කර ගැනීමෙන් පසු මුදල් විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඒ සමාගම වෙත තැන්පත් කළ යුතු අතර ඒ සමාගම විසින් ඊට හිමිකම් ඇති තැනැත්තන්ට ඒ වන්දි මුදල ගෙවිය යුතු ය.

වන්දියෙන් කළ යුතු අඩු කිරීම.

**21.** II වන කොටස යටතේ ආණ්ඩුව වෙත සතු කරනු ලැබූ යම් සමාගමක සම්පූර්ණ ව්‍යාපාරය වෙනුවෙන් හෝ ඒ ව්‍යාපාරයෙහි යම් කොටසක් වෙනුවෙන් යම් වන්දියක් ගෙවිය යුතු වන අවස්ථාවක, මුදල් විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ඒ වන්දියේ මුදලෙන්—

(අ) ආදායම හෝ ලාභ වෙනුවෙන් වූ බදු වශයෙන් හෝ පෞද්ගලික බදු වශයෙන් හෝ ඒ සමාගමෙන් ලැබිය යුතු යයි දේශීය ආදායම් කොමසාරිස්වරයාගේ අත්සන යටතේ ඒ ලේකම්වරයා වෙත සහතික කරනු ලැබූ යම් මුදලක් දේශීය ආදායම් කොමසාරිස්වරයාට ගෙවිය යුතුය ; තවද

(ආ) (i) හිඟ වැටුප්, අර්ථ සාධක අරමුදලේ දායක මුදල්, පාරිතෝෂික හෝ වෙනත් මුදල් ප්‍රතිලාභ වශයෙන්,

(ii) කම්කරු විනිශ්චය අධිකාරයක යම් ආඥාවක් මත හෝ බේරුම්කරුවකුගේ හෝ කාර්මික අධිකරණයක යම් තීරණයක් මත ලැබිය යුතු මුදල් වශයෙන්,

(iii) ඒ සමාගම හා ඒ තැනැත්තා හා අතර සමාදාන වීමෙන් ඇති කර ගත් යම් නිරවුල් කිරීමක් මත ලැබිය යුතු මුදල වශයෙන්, හෝ

(iv) ඒ සමාගම හා ඒ තැනැත්තා හා අතර කම්කරු කොමසාරිස්වරයා ඉදිරිපිට දී ඇති කර ගත් යම් නිරවුල් කිරීමක් මත ලැබිය යුතු මුදල වශයෙන්,

ඒ ව්‍යාපාරයෙහි සේවයෙහි නියුක්ත යම් තැනැත්තකුට ඒ සමාගමෙන් ලැබිය යුතු යයි කම්කරු කොමසාරිස්වරයාගේ අත්සන යටතේ ඒ ලේකම්වරයා වෙත සහතික කරනු ලැබූ යම් මුදලක් කම්කරු කොමසාරිස්වරයාට ගෙවිය යුතු ය.

## IV වන කොටස

### පොදු විධිවිධාන

පවරන ලද ව්‍යාපාරවල සේවයෙහි නියුක්ත කම්කරුවෝ.

22. ශ්‍රී ලංකාවෙන් පිටත ලියා පදිංචි කරනු ලැබූ (මේ වගන්තියෙහි "විදේශීය සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් සමාගමක් විසින් ශ්‍රී ලංකාව තුළ පවත්වා ගෙන යන යම් ව්‍යාපාරයක් මේ පනත ආරම්භ වීමෙන් පසු, (මේ වගන්තියෙහි "ශ්‍රී ලංකා සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන) ප්‍රධාන ප්‍රඥප්තිය යටතේ "පවත්නා සමාගමක්" වශයෙන් පිළිගනු ලැබූ හෝ සංස්ථාගත කරනු ලැබූ සමාගමකට පවරනු ලැබූ අවස්ථාවක—

(1) 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසාන කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ විධිවිධාන සහ යම් කම්කරුවකුගේ රක්ෂාව අවසාන කිරීමට පෙර දැන්වීමක් දීම පිළිබඳ වූ යම් නියමයක් ඒ ව්‍යාපාරයෙහි සේවයෙහි නියුක්ත යම් කම්කරුවකුගේ රක්ෂාව ඒ විදේශීය සමාගම විසින් අවසාන කිරීම කෙරෙහි අදාළ නොවන්නේ ය;

(2) ඒ ව්‍යාපාරයෙහි සේවයෙහි නියුක්ත එක් එක් කම්කරුවා ඒ පැවරීමට පෙරාතුවම සේවයෙහි නියුක්තව සිටි තත්ත්වයෙන්ම සහ ඒ පැවරීමට පෙරාතුවම ඔහුට අදාළ වූ නියමයන්ට හා කොන්දේසිවලට අඩු වාසි සහගත තත්ත්වයේ නොවන නියමයන් හා කොන්දේසි පිට ශ්‍රී ලංකා සමාගම විසින් අඛණ්ඩව සේවයෙහි නියුක්ත කළ යුතු අතර ඔහු ඒ විදේශීය සමාගම විසින් අඛණ්ඩව සේවයෙහි නියුක්ත කර ගනු ලැබුයේ නම් ඔහුට ලැබිය හැකිව තිබූ වේතන හෝ පාරිශ්‍රමික සහ වෙනත් සියලු ප්‍රතිලාභ ද ඒ ශ්‍රී ලංකා සමාගම විසින් ඔහුට ගෙවිය යුතු ය;

(3) විශ්‍රාම වැටුප්, පාරිතෝෂික, උසස් කිරීම් හෝ වෙනත් ප්‍රතිලාභ ප්‍රදානය කිරීමේ කාර්යය සඳහා විදේශීය සමාගමක් යටතේ වූ එකී යම් කම්කරුවකුගේ සේවා කාලය ශ්‍රී ලංකා සමාගම යටතේ වූ සේවයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ව්‍යාපාරය පවරනු ලැබීමේ හේතුව නිසා එකී යම් කම්කරුවකුගේ සේවයේ අඛණ්ඩතාව කඩ වූ ලෙස නො සැලකිය යුතු ය; තවද

(4) එකී යම් කම්කරුවකු විදේශීය සමාගම විසින් අඛණ්ඩව සේවයෙහි නියුක්ත කරනු ලැබ සිටියේ නම්, ඒ එක් එක් කම්කරුවා සම්බන්ධයෙන් කිරීමට ඒ විදේශීය සමාගම යටත් වන්නට තිබුණු, අර්ථසාධක අරමුදලේ දායක මුදල් ගෙවීම ද ඇතුළු වෙනත් සියලු ක්‍රියා, කරුණු සහ දේවල් කිරීමට ශ්‍රී ලංකා සමාගම යටත් වන්නේ ය.

මේ පනතේ කාර්ය පරිපාලන වියදම.

23. පනත සඳහන් ගෙවීම්, එනම්—

(අ) විනිශ්චය අධිකාරයේ සාමාජිකයන්ගේ, නිලධරයන්ගේ හෝ සේවකයන්ගේ පාරිශ්‍රමික; හා

(ආ) මේ පනත යටතේ වන්දි ලැබීමට හිමිකම් ඇති තැනැත්තන්ට ගෙවිය යුතු වන වන්දි

යන මේ ගෙවීම් ද ඇතුළුව මේ පනතේ කාර්ය පරිපාලනයෙහි ලා දරනු ලබන වියදම් ජාතික රාජ්‍ය සභාව විසින් ඒ කාර්යය සඳහා සපයනු ලබන මුදලින් මුදල් විෂයය භාර අමාත්‍යාංශයේ ලේකම් වරයා විසින් ගෙවිය යුතු ය.

මේ පනත යටතේ හෝ නියම බලධරයකුගේ විධානය පිට කරනු ලබන ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

**24.** (අ) නියම බලධරයකු විසින් මේ පනත යටතේ සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව ; හෝ

(ආ) මේ පනත යටතේ හෝ නියම බලධරයාගේ විධානය පිට හෝ වෙන යම් තැනැත්තකු විසින් සද්භාවයෙන් කරන ලද හෝ කරන ලදැයි සැලකෙන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඒ වෙනත් තැනැත්තාට විරුද්ධව

කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් නො විය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් කරනු ලබන වැරදි සම්බන්ධයෙන් විශේෂ විධිවිධාන.

**25.** පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වරදක් කරනු ලැබූ අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයකු හා නිලධරයකු ම ඒ වරදට වරදකරු ලෙස සැලකිය යුතු ය ;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවකුම ඒ වරදට වරද කරු ලෙස සැලකිය යුතු ය ; තවද

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාරික ආයතනයක් නො වන සංස්ථාගත නො කරන ලද මණ්ඩලයක් නම්, එම මණ්ඩලයේ සභාපති, කළමනාකරු, ලේකම් හා එහි සෑම නිලධරයකු ම ඒ වරදට වරදකරු ලෙස සැලකිය යුතු ය :

එසේ වුව ද, තමාගේ දැනුම නොමැතිව ඒ වරද කර ඇති බව හෝ ඒ වරද සිදු කිරීම වැළැක්වීමට තමා නිසි සියලු උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව එකී තැනැත්තකු විසින් ඔප්පු කරනු ලැබුවහොත් ඔහු වරදකට වරදකරු ලෙස නො සැලකිය යුතු ය.

මේ පනත ඇතැම් සාධන පත්‍ර සහ ප්‍රධාන ප්‍රඥප්තිය අභිභවා, බල පැවැත්විය යුතු බව.

**26.** (1) සමාගමක් පිහිටුවීම හෝ සංයුක්ත කිරීම පාලනය කෙරෙන නෑතහොත් ඊට අදාල යම් සාධන පත්‍රයක කුමක් සඳහන් ව ඇත ද මේ පනතේ විධිවිධාන බල පවත්වන්නේ ය.

(2) මේ පනතේ විධිවිධාන හා ප්‍රධාන ප්‍රඥප්තියේ විධිවිධාන සා අතර යම් ගැටුමක් හෝ නොගැළපීමක් ඇති වුවහොත් මේ පනතේ විධිවිධාන ඒ ප්‍රඥප්තියෙහි විධිවිධාන අභිභවා බල පැවැත්විය යුතු ය. එසේ වුව ද මෙහි මෙයට පෙර සැළැස්වුණු විධිවිධානවලට යටත් ව ඒ ප්‍රඥප්තියේ විධිවිධාන සමාගමක් සම්බන්ධයෙන් නො කඩ ව අදාළ වන්නේ ය.

අර්ථ නිරූපණය.

27. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අමාත්‍යවරයා" යන්නෙන් සමාගම් ආඥාපනතේ විෂයය හෝ කාර්යය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"අමාත්‍යාංශයේ ලේකම්වරයා" යන්නෙන් සමාගම් ආඥාපනතේ විෂයය හෝ කාර්යය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ;

"දේපළ" යන්නෙන් චංචල හෝ නිශ්චල දේපළ අදහස් වන නමුත් සමාගමක කොටස් හෝ තාවුවක මුදල් අය කර ගැනීමේ අයිතිවාසිකම් හෝ එයට ඇතුළත් නොවේ;

"නියම බලධරයා" යන්න සමාගමක සම්පූර්ණ ව්‍යාපාරය ම හෝ එහි යම් කොටසක් හෝ සම්බන්ධයෙන් යෙදෙන විට ඒ ව්‍යාපාරය හෝ එහි ඒ කොටස පාලනය කිරීමේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් 7 වන වගන්තිය යටතේ නියම බලධරයකු ලෙස පත් කරන ලද තැනැත්තා ඉන් අදහස් වේ;

"ප්‍රධාන ප්‍රඥප්තිය" යන්නෙන් කලින් කල සංශෝධිත සමාගම් ආඥාපනත අදහස් වේ;

"භාණ්ඩාගාරය" යන්නෙන් මහා භාණ්ඩාගාරය යනුවෙන් හඳුන්වනු ලබන ආණ්ඩුවේ දෙපාර්තමේන්තුව අදහස් වේ;

"ව්‍යාපාරය" යන්න සමාගමක් සම්බන්ධයෙන් යෙදෙන විට ඒ සමාගම විසින් පවත්වාගෙන යනු ලබන ව්‍යාපාර කටයුතු ඉන් අදහස් වන අතර ඒ සමාගමේ සියලු ම චංචල හා නිශ්චල දේපළ හා අනිකුත් වත්කම් ද එයට ඇතුළත් වේ;

"සමාගම" යන්නට යම් නියෝජිත ආයතනයක් සහ ව්‍යාපාර නාම ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද යම් ව්‍යාපාර යක් ඇතුළත් වේ.